# ස්වයං අධ්‍යයනයට අත්වැලක්

- **ශ්‍රේණිය** - 6 ශ්‍රේණිය - පළවන වාරය
- **නිපුණතාවය 5.0** - ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැකගැනීම සඳහා ක්‍රියාකරයි
- **නිපුණතා මට්ටම 5.1** - ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි සාරධර්ම අගයමින් අදහස් දක්වයි
- **ක්‍රියාකාරකම 5.1.1** - ගුරු ගෙදර හා සබැඳි සාරධර්ම සුරකිමු




**සැකසුම :-** සමන්ති පුණ්‍යවර්ධන
මප/වත්/මහනුවර ආදර්ශ විදුහල
පොල්ගොල්ල

**මෙහෙයවීම :-** නර්තන අංශය
වත්තේගම අධ්‍යාපන කලාපය

- ඈත අතීතයේදී නර්තන අධ්‍යාපනය හැදෑරවීමට ගුරුවරයාගේ ගෙදරට ගොස් තම දරුවා දෙමාපියන් විසින් බාරදෙනු ලබයි.



- දරුවා ගුරුවරයාගේ සියලු වැඩවලට සහය වෙමින් අධ්‍යාපනය ප්‍රායෝගිකව අත්විඳීමට අවස්ථාව උදාකර ගනියි.එමගින් වරදට දඬුවම් ලැබීම,අණට කීකරු වීම,පිළිවලට වැඩකිරීම ආදී බොහෝ යහපත් ජීවන අත්දැකීම් ඔහුට ලබාගැනීමට හැකිවේ.



- ගුරුවරයා සමග බෙරය කරේ දාගෙන පසුපසින් ගමන්ගන්නා ගෝලයට බෙරයේ ලකබුරුල අනුව වාදනය හුරුකරගන්නා ආකාරය පිළිබඳ හසළ දැනුමක් ලබාගැනීමට හැකි වේ. ශාන්තිකර්ම සැරසිළිවලදී ගොක්කොළ කැටයම් කැපීම,ගොක්කොළ ඇල්ලීම ආදී අත්දැකීම් මගින් ආදුනික ශිල්පියා හොඳ පන්නරයක් ලබාගනියි



ගොප්කොළ ඇල්ලීම



ශාන්තිකර්ම සැරසිළි

- කලක් ගතවීමෙන් පසු ආදුනිකයා සියලු ශාස්ත්‍ර ප්‍රගුණ කරගත් ශිල්පියෙක් බවට පත් වේ.



# ගුරු ගෙදර හා සබැඳි නර්තන අධ්‍යාපනයේ චාරිත්‍ර

- ගුරු ගෙදරට දෙමව්පියන් සමග ගොස් බුලත් හුරුල්ලක් දී නර්තනය හැදෑරවීමට දරුවා ගුරුවරයාට භාර දීම.



- ගුරුවරයාට නමස්කාර කිරීම.

ඕවාද සිප්ප දානේන - සික්ඛාපේතී මමං ගරුං
සඝාරවේන චිත්තේන - අහං වන්දාමි තං ගරු

ඔවා සිප් දීමෙන - මා හික්මවන ප්‍රේමෙන
ඇදුරු හද බැතියෙන - වඳිමි ගරුසිත පෙරටු කරගෙන

- දණ්ඩි කදට නමස්කාර කිරීම.



- වැඩිහිටි අනුපිළිවලට අනුව ශිල්පීන්ට ගරුකිරීම



- වැඩිහිටියන්ට ගරුකිරීම
- වාද්‍ය භාණ්ඩ හා රංග වස්ත්‍රාභරණ වලට ගරුකිරීම

## ගුරු ගෙදරදී මෙන්ම පන්ති කාමරයේ දී ආදුනික නර්තන ශිල්පියකු විසින් අනුගමනය කළයුතු සාරධර්ම

- තෙරුවන් නැමදීම නැතහොත් ආගමට මුල්තැන දී කටයුතු කිරීම
- පාවහන් ගලවා පන්ති කාමරයට හා රග මඩලට ප්‍රවේශ වීම
- ගුරුවරයා නැමඳ ආශිර්වාද ගැනීම
- වැඩිහිටියන්ගෙන් ආශිර්වාද ලබාගැනීම

වැනි සාරධර්ම වර්ධනය කර ගැනීමත් පාසලේ දී සහ පන්ති කාමරයේ දී ත් සමාජයේදීත් ප්‍රජාව සමග කටයුතු කිරීමේදී සාමූහික හැඟීමෙන් යුතුව නායකත්වයට ගරු කරමින්

කටයුතු කිරීමට ආදුනික නර්තන ශිල්පියා නර්තන විෂය හැදෑරීම මගින් ප්‍රගුණ තත්ත්වයට පත්විය යුතු අතර ශ්‍රී ලාංකේය අනන්‍යතාව ආරක්ෂා වන පරිදි

සංස්කෘතිකාංග ආරක්ෂා කිරීමටද ආධුනික නර්තන ශිල්පියෙකු පුරුදු පුහුණු විය යුතුය.